අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education,Higher Education and vocational Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) උපකාරක තක්සේරුව - 2026
கல்வி பொதுத் தராதரப் பத்திர (சாதாரண தர) உதவி மதிப்பீடு - 2026
General Certificate of Education (Ord, Level) Supportive Assessment - 2026

ඉතිහාසය

History - வரலாறு

උපකාරක තක්සේරුව
உதவி மதிப்பீடு
Supportive Assessment

සිංහල මාධ්‍යය



Question Paper – I ,II ප්‍රශ්න පත්‍රය- I,II

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය - ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව
Minister of Education, Higher Education and Vocational Education – National Language and Humanities Branch
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு - மொழிகள் மற்றும் மானுடவியல் பிரிவு

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

කල්වි උයර් කල්වි මර්‍රුම් තොළිර්කල්වි අමైච්සු

Ministry of Education,Higher Education and vocational Education

33	S	I

ඉතිහාසය I
வரலாறு I
History I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) උපකාරක තක්සේරුව - 2026
கல்வி பொதுத் தராதரப் பத்திர (சாதாரண தர) உதவி மதிப்பீடு- 2026
General Certificate of Education (Ord, Level) Supportive Assessment - 2026

පැය එකයි
ஒரு மணித்தியாலம்
One hour

උපදෙස්

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- **අංක 1- 40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1),(2),(3),(4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**

1. ශ්‍රී ලංකාවේ ශාසන ඉතිහාසය පිළිබඳ හැදෑරීමට උපකාරී වන ග්‍රන්ථය මින් කුමක් ද?
(1) රාජාවලිය (2) බෝධිවංසය (3) නිකාය සංග්‍රහය (4) පූජාවලිය

2. මහනුවර රාජධානි සමයේ දී උඩරට සිරකරුවෙකු ලෙස සිට සිය අත්දැකීම් ඇසුරෙන් තොරතුරු වාර්තා කළ ඉංග්‍රීසි ලේඛකයා කවරෙක් ද?
(1) රිබෙයිරෝ (2) රොබට් නොක්ස් (3) ජෝන් ඩොයිලි (4) පිලිප්පස් බැල්දියස්

3. අතීතයේ දී ධීවරයින් විසූ ගම් හැඳින් වූ නම කුමක් ද?
(1) ඔලගම් (2) කසීකාරගාම (3) පට්ඨනගාම (4) කේවට්ටගාම

4. ගෘහපතීන් අතරින් ම ගම්කයන් පත් වූ බවට තොරතුරු සඳහන් වී ඇති කෘතියේ රචකයා වන්නේ,
(1) බුද්ධඝෝෂ හිමි ය. (2) මහානාම හිමි ය. (3) පාහියන් හිමි ය. (4) හියුංසෑං හිමි ය.

5. පහත සඳහන් පාලකයන් අතරින් "**නරේශ්වර**" යන නාමයෙන් තමන් හඳුන්වාගත් රජතුමා කවරෙක් ද?
(1) පළමුවන කාශ්‍යප (2) නිශ්ශංකමල්ල (3) කූටකණ්ණාභය (4) මහසෙන්

6. පහත දැක්වෙන කරුණු අතරින් රටේ පරිපාලනය විධිමත් කිරීම සඳහා වසභ රජතුමා අනුගමනය කළ **වැදගත් ම** පියවර වන්නේ,
(1) මහවැව් ඉදිකිරීම ආරම්භ කිරීම ය.
(2) රට ආස්ථාන වලට බෙදා පාලනය කිරීම ය.
(3) අසල්වැසි ඉන්දියාව සමග රාජතාන්ත්‍රික සබඳතා ගොඩනගා ගැනීම ය.
(4) අනුරාධපුරය සංවිධානාත්මක නගරයක් බවට පත් කිරීම ය.

7. පහත **I තීරුවේ** රජවරු කිහිපදෙනෙකු හා **II තීරුවේ** එම රජවරු සම්බන්ධ කරුණු කිහිපයක් දැක්වේ. **I තීරුව** අනුව **II තීරුව** ගැළපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

I තීරුව	II තීරුව
1. භයවන අග්බෝ 2. පළමුවන ගජබාහු 3. භාතිකාභය	A – චේර රාජ්‍යයේ පත්තිනි දේවාලයක් විවෘත කිරීමට සහභාගී වීම B – ඊජිප්තුවට දූතයින් යැවීම C – චීනය සමඟ විසිවතාවක් රාජතාන්ත්‍රික සබඳතා පැවැත්වීම D – රෝමයෙන් වීදුරු පබළු ගෙන්වීම

(1) B,C හා D (2) C,D හා B (3) C,A හා D . (4) D,C හා B

8. අරාබි ජාතික ඉතිහාසඥයකු වූ අල්බලසූරි ශ්‍රී ලංකාව හඳුන්වා ඇති නම කුමක් ද?
(1) රතුකැට දිවයින (2) සරන්ඩිබ් (3) රත්නදීප (4) සෙයිලන්

9. පැරණි බෞද්ධ ආරාමවල නායක ස්වාමීන් වහන්සේ යටතේ වැඩවාසය කළ භික්ෂූන් වහන්සේලා හඳුන්වා ඇති නාමය කුමක් ද?
(1) භාණකවරු (2) අන්තේවාසික (3) ථෙර (4) සදිවිහරිය

10. අතීත සමාජයේ වැව් පද්ධතියක් භාරව කටයුතු කළේ,
(1) ගෘහපති ය. (2) ගමික ය. (3) දසගම් ඇත්තන් ය. (4) පරුමක ය.

11. මාතොට වරාය ආසන්නයේ පිහිටි ප්‍රසිද්ධ කෝවිල කුමක් ද?
(1) කෝණේශ්වරම් (2) තිරුකේතීශ්වරම් (3) මුන්නේශ්වරම් (4) නල්ලූර්

• පහත A සිට E දක්වා ප්‍රකාශ හොඳින් කියවා 12 හා 13 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.
A - අත්තිවාරම සැකසීම වර්තමාන කොන්ක්‍රීට් තාක්ෂණයට සමාන වීම.
B - ස්ථිතික ජල විද්‍යා මූලධර්ම භාවිතකොට නිමවා තිබීම.
C - අකුණුවලින් ආරක්ෂා වීමට සන්නායක සවිකර තිබීම.
D - ලෝකඩ මාධ්‍ය භාවිතයෙන් නිමවා තිබීම.
E - යකඩමරං ශාකයේ අඟුරු භාවිතයට ගැනීම.

12. රුවන්වැලිසෑය ඉදිකිරීම සම්බන්ධයෙන් තොරතුරු දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A සහ C (2) A සහ D (3) B සහ C (4) D සහ E

13. දැදිගම ඇත්පහන සම්බන්ධ තොරතුරු දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A සහ C (2) B සහ D (3) B සහ E (4) C සහ D

14. ක්‍රිස්තු පූර්ව 2400 ට කාල නිර්ණය කරන ලද යබොර කැබැල්ලක් හමුවූ සොහොන් බිම කුමක් ද?
(1) බෙරගල (2) හල්දුම්මුල්ල (3) දෙහිගහ ඇළකන්ද (4) සමනලවැව

15. බෝවත්තේගල සෙල්ලිපියේ "**කබොජ මහ පුගිය** " යන යෙදුමෙන් දක්වා ඇති වෙළෙඳ සමූහය ට අයත් වෙළෙඳුන් ලංකාවට පැමිණ ඇත්තේ,
(1) ග්‍රීසියෙනි. (2) මැසිඩෝනියාවෙනි. (3) ඇෆ්ඝනිස්ථානයෙනි. (4) කාම්බෝජයෙනි.

16.මාඝාත නීතිය මුල්වරට පනවන ලද පාලකයා කවරෙක් ද?
(1) හතරවන මහින්ද (2) භාතිකාභය
(3) කීර්ති ශ්‍රී මේඝවර්ණාභය (4) අමණ්ඩගාමිණී අභය

17. ශ්‍රී ලංකාවේ පැවති රාජධානි කිහිපයක් **I තීරුවේ** ද එම රාජධානි අවධීන් වල රචිත ග්‍රන්ථ කිහිපයක් **II තීරුවේ** ද දැක්වේ. **I තීරුව** අනුව **II තීරුව** ගැළපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

I තීරුව	II තීරුව
1. දඹදෙණිය 2. කුරුණෑගල 3. ගම්පොළ	A – දළදාසිරිත B – මයුර සංදේශය C – සද්ධර්මරත්නාවලිය D – සද්ධර්මරත්නාකරය

(1) A,B හා D (2) A,C හා D (3) B,C හා A (4) C,A හා B

18. මාතෘමූලික රාජ්‍ය උරුම සම්ප්‍රදායක ආරම්භය දැකගත හැකි වූයේ කිනම් රාජධානි සමයක දී ද?
(1) යාපහුව (2) කුරුණෑගල (3) ගම්පොළ (4) කෝට්ටේ

19. උඩරට රාජධානියේ ක්‍රියාත්මක වූ "**මඩිගෙ බද්ද** " කාර්යාංශයේ කාර්යයභාරය වන්නේ,
(1) වළං තැනීම ය. (2) ප්‍රවාහන කටයුතු ය. (3) ඇතුන් ඇල්ලීම ය. (4) රෙදි විවීම ය.

20. "**නින්දගම්**" යනුවෙන් හඳුන්වනු ලබන්නේ,
(1) රජ වාසල ප්‍රයෝජනය සඳහා වෙන් කරන ලද ඉඩම් ය.
(2) ගම් වැසියන් පරම්පරාගතව බුක්ති විඳින ලද ඉඩම් ය.
(3) විහාරාරාම වෙත පූජා කරන ලද ඉඩම් ය.
(4) රදළ ප්‍රධානීන් ඉටු කළ සේවය වෙනුවෙන් ප්‍රදානය කරන ලද ඉඩම් ය.

21. පුනරුදෙ සමයේ කලා ශිල්ප අතරින් පුළුල් වෙනසකට ලක් වූයේ,
(1) ගෘහ නිර්මාණ යි. (2) චිත්‍ර කලාව යි. (3) ප්‍රතිමා කලාව යි. (4) කැටයම් කලාව යි.

22 ක්‍රි.ව.1505 දී පෘතුගාල රජු විසින් පෙරදිග පෘතුගීසි ප්‍රතිරාජයා ලෙස පත්කරන ලද්දේ කවුරුන් ද?
(1) ලොරෙන්සෝද අල්මේදා
(2) පේරෝ ලොපෙස් ද සූසා
(3) ෆ්‍රැන්සිස්කෝ ද අල්මේදා
(4) කොන්ස්තන්තීනු ද සා

23.යාපන රාජධානිය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) පුවිරාජපණ්ඩරම් යාපන රාජධානියේ ආරම්භක පාලකයා වේ
(2) ආර්යචක්‍රවර්ති පාලකයන් කෝට්ටේ රාජධානියට අයත් ප්‍රදේශවලින් බදු අයකරගෙන ඇත
(3) යාල්පාන වෛපවමාලෛ ග්‍රන්ථයේ යාපනයේ සිටි පාලකයන් දොළොස් දෙනෙකු පිළිබඳ සඳහන් වේ
(4) පෘතුගීසීන් ලංකාවට පැමිණෙන විට යාපන ප්‍රදේශය පාලනය කරන ලද්දේ සංකිලි රජතුමා ය

24. කොළඹ සිට මහනුවර දක්වා දුම්රිය මාර්ග ඉදිකිරීම සඳහා මූලිකත්වය ගත් ආණ්ඩුකාරවරයා කවුද?
(1) හෙන්රි වෝඩ් (2) එඩ්වඩ් බාන්ස් (3) ටොරින්ටන් (4) පෙඩ්රික් නෝර්ත්

25. ක්‍රි.ව.1818 පළමු නිදහස් සටනේ දී ඉංග්‍රීසීන්ට සහය වූ රදළවරයා කවුරුන් ද?
(1) මොල්ලිගොඩ දිසාව (2) බූටෑවේ රටේරාල
(3) ඇහැලේපොල අධිකාරම් (4) දඹවින්න දිසාව

26. පහත A සිට D දක්වා දී ඇති ප්‍රකාශන අතුරෙන් මිෂනාරි සංවිධාන ශ්‍රී ලංකාවේ දී මුද්‍රණය කළ ප්‍රකාශන පමණක් දැක්වෙන පිළිතුර කුමක් ද?
A - උරගල B- උදයභාණු C- ලක්මිණ පහන D-ලංකා නිධානය

(1) A හා C (2) A හා D (3) B හා C (4) C හා D

27. කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ පාලන සමයේ දී උඩරටට පැමිණි ඉංග්‍රීසි දූතයා කවුද?
(1) ජෝන් පයිබස් (2) ජෝන් ඩොයිලි (3) හියු බොයිඩ් (4) රොබට් ඇන්ඩaaස්

28. ශ්‍රී ලංකාවේ පළමු බෞද්ධ මුද්‍රණාලය වන්නේ,
(1) ලංකාභිනව විශ්‍රැත මුද්‍රණාලය යි. (2) සුදර්ශන මුද්‍රණාලය යි.
(3) ලංකෝපාකාර මුද්‍රණාලය යි. (4) සරසවි සඳරැස මුද්‍රණාලය යි.

29. ශ්‍රී ලංකාවේ ඉස්ලාම් ආගමික පුනරුද ව්‍යාපාරයට නායකත්වය ලබා දුන් ඔරාබි පාෂා කිනම් රටක සිට ලංකාවට පැමිණි අයෙක් ද?
(1) අරාබිය (2) ඇෆ්ගනිස්ථානය (3) පර්සියාව (4) ඊජිප්තුව

30. දෙමළ සිසුන් අතර ඉංග්‍රීසි අධ්‍යාපනය ප්‍රචලිත කිරීම සඳහා ආරුමුග නාවලර්තුමා ගත් පියවරක් වන්නේ,
(1) ශෛව ප්‍රකාශ විද්‍යාලය පිහිටුවීම යි. (2) උදයභාණු පුවත්පත ආරම්භ කිරීම යි.
(3) ශිවන්ගල විද්‍යාලය ආරම්භ කිරීම යි. (4) යාපනය ප්‍රදේශයේ මුද්‍රණාලයක් ආරම්භ කිරීම යි.

31. ලංකා සංගමය පිහිටුවීමට මූලිකත්වය ගත්තේ,
(1) පොන්නම්බලම් අරුණාචලම් මහතා ය. (2) සර් ජේම්ස් පීරිස් මහතා ය.
(3) හෙන්රි මැකලම් මහතා ය. (4) ජෝර්ජ් වෝල් මහතා ය.

32. සීමිත ඡන්ද බලය ලංකාවට හඳුන්වා දුන් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය කුමක් ද?
(1) කෝල්බaaක් (2) කaaව්- මැකලම් (3) මැනිං (4) ඩොනමෝර්

33. රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මුලසුන දරන ලද්දේ,
(1) ආණ්ඩුකාරවරයා විසිනි. (2) අග්‍රාණ්ඩුකාරවරයා විසිනි.
(3) කතානායකවරයා විසිනි. (4) අගමැතිවරයා විසිනි.

34. ශ්‍රී ලංකාවේ තේ පර්යේෂණායතනය දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) තලවකැලේ (2) ලුණුවිල (3) අගලවත්ත (4) ගන්නෝරුව

- පහත A හා B ප්‍රකාශ අතුරෙන් ප්‍රශ්න අංක 35 සඳහා පිළිතුරු සපයන්න.
A . එක්සත් ජාතික පක්ෂයට ජයග්‍රහණය හිමි වීම.
B. සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට පත් කිරීම.

35. 1956 වර්ෂයේ පැවති මහ මැතිවරණය සම්බන්ධයෙන්,
(1) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (2) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.
(3) A හා B සත්‍ය වේ. (4) A හා B අසත්‍ය වේ.

36. උතුරු ඇමරිකානු ප්‍රදේශවල ජනාවාස පිහිටුවාගත් යුරෝපා ජාතීන් කවුරුන් ද?

(1) ස්පාඤ්ඤුවරුන් හා පෘතුගීසී ජාතිකයන්
(2) පෘතුගීසී ජාතිකයන් හා බ්‍රිතාන්‍ය ජාතිකයන්
(3) ප්‍රංශවරුන් හා ඕලන්ද ජාතිකයන්
(4) බ්‍රිතාන්‍ය ජාතිකයන් හා ප්‍රංශවරුන්

37. ප්‍රංශ විප්ලවයට බලපෑ ආර්ථික හේතුවක් **නොවන්නේ** මින් කුමක් ද?

(1) රදළයන්ට රටේ ඕනෑම තැනක දඩයම් කිරීමට අවස්ථාව සැලසීම
(2) අනවශ්‍ය යුධ වියදම්
(3) අසාධාරණ බදු ප්‍රතිපත්තිය
(4) රජ පවුලේ නඩත්තුවට විශාල මුදලක් වැය කිරීම

- පහත A, B,C හා D යටතේ ප්‍රකාශ යුගලය බැගින් දක්වා ඇත. මෙහි පළමු වැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාව පරීක්ෂා කර බලා 38 සිට 40 දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – 1. පළමු ලෝක සංග්‍රාමය
2. වර්සෙල්ස් ගිවිසුම

B – 1. පැරිස් සාම සාකච්ඡාව
2. එක්සත් ජාතීන්ගේ සංවිධානය

C - 1. මධ්‍යම බලවතුන් පරාජයට පත්වීම
2. ඇමරිකාවේ සහය මිත්‍ර පිලට හිමි වීම

D – 1. මහා මණ්ඩලය
2. මහ ලේකම්වරයා පත්කිරීම

38. කිසිදු සබඳතාවක් නොදක්වන පද යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

39. දෙවැන්න, පළමුවැන්නේ ප්‍රතිඵලයක් බව ප්‍රකාශ කෙරෙන යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

40. පළමුවැන්න සඳහා දෙවැන්න හේතු වූ බව ප්‍රකාශ කෙරෙන යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education,Higher Education and vocational Education

33 | S | II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) උපකාරක තක්සේරුව - 2026
கல்வி பொதுத் தராதரப் பத்திர (சாதாரண தர) உதவி மதிப்பீடு- 2026
General Certificate of Education (Ord, Level) Supportive Assessment - 2026

ඉතිහාසය	II
வரலாறு	II
History	II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

උපදෙස්:

- **I** කොටසේ ප්‍රශ්න අංක **1** අනිවාර්ය වේ.
- **II** කොටසින් ප්‍රශ්න **හතරකට** ද, **III** කොටසින් ප්‍රශ්න **එකකට** ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **හයකි.**

I කොටස


1. (අ) (i) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න.
යාන් ඔය, කළු ගඟ, යෝධ වැව, මාදුරුඔය ජලාශය, කුරුණෑගල, කැලණිය,ගොඩවාය
ලංකාපටුන, ඉබ්බන්කටුව, කතරගම, කදුරුගොඩ විහාරය, මහියංගණය (ලකුණු12යි)

(ii) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ලකුණු කර නම් කරන්න.
පෝලන්තය, ඒජියන් මුහුද, සියම, ඇෆ්ගනිස්ථානය, බොම්බාය, ප්ලෝරන්ස්
(ලකුණු 06යි)

(ආ) (i) පහත *A, B, C* හා *D* යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.
A - ඇළ මාර්ග ඉදි කිරීම සම්බන්ධයෙන් කටයුතු කළ නිලධාරීන් සෙල්ලිපිවල හඳුන්වා ඇති නම කුමක් ද?
B - අදිකාරම්වරුන්ගේ ආඥා හා පණිවිඩ ප්‍රාදේශීය නිලධාරීන් කරා ගෙන ගිය පිරිස හැඳින් වූයේ කවර නමකින් ද?
C - ව්‍යවස්ථාදායක සභාවට මුල්වරට තේරී පත් වූ උගත් ලාංකීක මන්ත්‍රීවරයා නම් කරන්න.
D - ඇමෙරිකා එක්සත් ජනපදයේ ප්‍රථම ජනාධිපතිවරයා කවරෙක් ද? (ලකුණු 04 යි)

- *A* සහ *B* යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

(ii) 1. *A* රූපයෙන් දැක්වෙන නිර්මාණය කුමක් ද?
2. මෙම නිර්මාණය ඉදිකර ඇත්තේ කුමන ඔය හරහා ද?
3. මෙම නිර්මාණය දැකි හැකි ඓතිහාසික නගරය නම් කරන්න.
4. මෙම නිර්මාණයෙන් පිළිබිඹු වන තාක්ෂණික ක්ෂේත්‍රය කුමක් ද?



A
(ලකුණු 04 යි)



B
(ලකුණු 04 යි)

(iii) 1. *B* රූපයෙන් දැක්වෙන පුද්ගලයා කවුද?

2. ඔහු පාලකයා ලෙස කටයුතු කළ රට කුමක් ද?

3. ඔහුගේ අත්සනින් ලංකාවට එවන ලද ප්‍රසිද්ධ ලිපිය හැඳින් වූ නම කුමක් ද?

4. එම ලිපිය එවන විට ලංකාවේ සිටි ලන්දේසි ආණ්ඩුකාරවරයා කවරෙක් ද?

II කොටස

2. (i) ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු සඳහන් වන දකුණු ඉන්දීය මූලාශ්‍රය ග්‍රන්ථ **තුනක්** නම් කරන්න.
(ලකුණු 03 යි)

(ii) ශිලා ලිපි නිර්මාණය කර ඇති ස්වරූපය අනුව වර්ග කළ හැකි ආකාර **හතරක්** ලියා දක්වන්න.
(ලකුණු 04 යි)

(iii) ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී සාහිත්‍ය මූලාශ්‍රයවල ප්‍රයෝජන **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) පුරාවස්තු රැකගැනීමේ වැදගත්කම කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

3. (i) ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා ශිලා මෙවලම් යොදා ගෙන සිදු කළ කාර්යයන් **තුනක්** නම් කරන්න.
(ලකුණු 03 යි)

(ii) ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා වාසස්ථාන තෝරා ගැනීමේ දී අවධානය යොමු කළ සාධක **දෙකක්** ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) පූර්ව ඓතිහාසික යුගයේ දැකගත හැකි සුසාන විධි **දෙකක්** නිදසුන් ඇසුරෙන් විස්තර කරන්න.
(ලකුණු 05 යි)

(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

4 . (i) අතීතයේ මෙරට රෝහල් ඉදි කිරීමට කටයුතු කළ පාලකයන් **තිදෙනෙකු** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) අතීත ජනයා හේනක් සකස් කර ගැනීමේ දී අනුගමනය කළ පියවර **දෙකක්** නම් කරන්න.
(ලකුණු 04 යි)

(iii) මෙරට පැරණි සමාජයේ නීතිය හා සම්ප්‍රදාය ක්‍රියාත්මක වූ ආකාරය පහත සඳහන් ක්ෂේත්‍ර **දෙක** ඔස්සේ උදාහරණ එක බැගින් දක්වමින් විස්තර කරන්න.

A - වෙළෙඳාම
B - පරිසරය (ලකුණු 05 යි)

(iv) පැරණි ජන සමාජයේ කාන්තාවට ගෞරවනීය ස්ථානයක් හිමි වූ බව කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

5. (i) පළමු නාගරීකරණයට අයත් පාලන මධ්‍යස්ථාන **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පෙළොන්නරුව රාජධානිය බිඳ වැටීමෙන් පසුව බිහි වූ පහත සඳහන් පාලන මධ්‍යස්ථානවල පාලකයන් දී ඇති වරහන තුළින් තෝරා ලියා දක්වන්න.

A - යාපහුව
B - දඹදෙණිය
C - මිණිපේ ගංදෙණිය
D - ගෝවින්ද මලය
(සංඛ සෙනෙවි, සුභ සෙනෙවි, බෝසත් විජයබාහු, බුවනෙකබාහු ආදිපාද, වන්නි විජයබාහු)
(ලකුණු 04 යි)

(iii) භයවන පරාක්‍රමබාහු රජුගේ සේවය කරුණු **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න.
(ලකුණු 05 යි)

(iv) දෙවන නාගරීකරණ අවධියේ ආර්ථික රටාවේ දැකිය හැකි ලක්ෂණ **තුනක්** පැහැදිලි කරන්න.
(ලකුණු 06 යි)

6. (i) ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පාලනය කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරවරුන් **තිදෙනෙකු** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) මියුරන් කොමිසමේ නිර්දේශ **දෙකක්** ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) බ්‍රිතාන්‍යයන්ගේ පැමිණීම නිසා මෙරට සමාජයේ සිදු වූ වෙනස්කම් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) බ්‍රිතාන්‍ය පාලනය හේතුවෙන් ශ්‍රී ලංකාවට උරුම වූ ප්‍රයෝජනවත් අංග **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

7. (i) නිදහස ලබා ගැනීමට පෙර ශ්‍රී ලංකාවේ බිහි වූ දේශපාලන පක්ෂ **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ක්‍රි.ව. 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික ලක්ෂණ **දෙකක්** ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) ක්‍රි.ව. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හඳුන්වා දුන් ඡන්ද විමසීමේ ක්‍රම **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) නිදහසින් පසු ශ්‍රී ලංකාවේ කාර්මික ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්කම් **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

III කොටස

8. (i) පුනරුදය සමයේ සිටි ගත්කතුවරුන් **තුන් දෙනෙකු** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත A සිට D තෙක් ඇති පුනරුදය සමයේ නව සොයා ගැනීම් සිදු කළ පුද්ගලයින් කවුරුන්දැ'යි **අනුපිළිවෙළින්** ලියා දක්වන්න.

A - දූරේක්ෂය
B - ගුරුත්වාකර්ෂණ නියමය
C - රුධිර සංසරණ පද්ධතිය
D - මුද්‍රණ යන්ත්‍රය

(ලකුණු 04 යි)

(iii) පුනරුදය හේතුවෙන් ගෝලීය වශයෙන් ඇති වූ ප්‍රවණතා **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) පුනරුදයේ බලපෑම නිසා ශ්‍රී ලංකාවේ ආර්ථික ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්කම් **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

9. (i) කාර්මික විප්ලවය සමයේ පේෂ කර්මාන්තයේ දියුණුව සඳහා උපකාරී වූ නව නිපැයුම් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ගල් අඟුරු කැණීම් කටයුතුවල දී පතල් කාර්මිකයන් මුහුණ දුන් අභියෝග දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) කාර්මික විප්ලවය සමයේ සන්නිවේදන ක්ෂේත්‍රයේ ඇති වූ දියුණුව නිදසුන් **දෙකක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) කාර්මික විප්ලවය නිසා ලෝක දේශපාලනයේ ඇති වූ වෙනස්කම් **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

*****

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education,Higher Education and vocational Education

33 | S | II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2026


கல்விப் பொது தராதரப் பத்திர சாதாரண தரப் பரீட்சை - 2026

General Certificate of Education (Ord. Level) Examination - 2026

ඉතිහාසය	II
வரலாறு	II
History	II

1 . (අ) (i)

විභාග අංකය}.....



1 . (ඇ) (ii)

